ස.සේ.කො.චක්‍රලේඛ අංක : 07/2021

මගේ අංකය : ස.සේ.කො./5/1/iii වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2021.08.09

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩල වල,
ගරු සභාපති / සාමාන්‍යාධිකාරී/ කළමනාකරු.

## කොරෝනා වෛරස් තත්ත්වය හේතුවෙන් නිරෝධායන කටයුතුවලට යොමුවන සේවකයින්ට නිවාඩු ලබා දීම.

කොරෝනා වෛරසය වැළඳී ඇතැයි සැක සහිත වයඹ පළාත් සමුපකාර සේවකයින් නිරෝධායන කටයුතු සඳහා යොමු කර ඇති අවස්ථාවකදී එම සේවකයින්ගේ නිවාඩු සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතු බවට 2021.07.28 දින රැස්වූ කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. ඉහත පරිදි වයඹ පළාත් සමුපකාර සේවකයින් නිරෝධායන කටයුතු සඳහා යොමු කර ඇති අවස්ථාවකදී එම කාල සීමාව, සේවකයාට වැටුප් සහිත විශේෂ නිවාඩුවක් සේ සැළකිය යුතුය.

02. එම නිවාඩු සේවකයාගේ සාමාන්‍ය නිවාඩුවලින් අඩු නොකළ යුතු අතර මේ යටතේ නිවාඩු ලබා ගැනීම සඳහා අදාල කොට්ඨාසයට අයත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ බලය ලත් නිලධාරී විසින් නිකුත් කරනු ලබන (පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක/සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී) සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

03.මෙම විධි විධාන 2021.07.28 දින සිට බලාත්මක වේ.

මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ.හේරත්
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ)

<u>පිටපත්</u>- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පලාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර් (වයඹ පළාත) - දැ.ගැ.පි - අ.කා.ස.
4. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.කා.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.කා.ස.